**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය - 2015**

-----------------------------------------------------------

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරීත්වය ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 38 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

2. **මූල්‍ය ප්‍රකාශන**
**----------------**

2.1. **මතය**
**------**

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-----------------------------------------**

2.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

රජයේ ප්‍රතිපාදන මත ලැබී තිබුණු වාහන වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ගණනය කරන ලද ක්ෂය ප්‍රමාණය රු.7,239,500 ක් ලෙස ගිණුම් සටහන්වල දක්වා තිබුණද දේපළ පිරියත උපකරණ යටතේ එම ප්‍රමාණය රු.7,399,500 ක් ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය රු.160,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. එසේම ඉකුත් වර්ෂවලට අදාළ සමුච්චිත ක්ෂය ප්‍රමාණය අදාළ සටහන් අනුව රු.20,416,667 ක් ලෙස දක්වා තිබුණ ද එය දේපළ පිරියත හා උපකරණ යටතේ රු.20,643,333 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමුච්චිත ක්ෂය රු.226,666 ක් වැඩියෙන් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය.

2.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ පහකට වඩා පැරණි එකතුව රු. 10,446,752 ක රුදවුම් මුදල් ආදායමට ගැනීමට හෝ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

(ආ) ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට අත්පන්දු ක්‍රීඩාංගනයක් ඉදිකිරීම සඳහා 2010 වර්ෂයේ දී රු. 233,174 ක අත්තිකාරමක් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය වන විටත් වැඩ ආරම්භ කර නොතිබුණි. එසේ වුවද අදාල අත්තිකාරම් මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**
---------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
| --- | --- |
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන සඳහා වූ ආයතන සංග්‍රහයේ 20 වෙනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 10 වෙනි පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය. | අධ්‍යයන සේවකයින්ගේ පැමිණීම, පිටවීම සහ නිවාඩු සනාථ කර ගැනීමකින් තොරව වැටුප් හා දීමනා ලෙස රු.65,603,821 ක් ගෙවා තිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 371 (2) | නිලධාරීන් 4 දෙනෙකුට අවස්ථා 5 කදී ලබාදී තිබූ එකතුව රු.147,750 ක අත්තිකාරම් දින 07 සිට දින 94 දක්වා කාලයක් අත රඳවා ගැනීමෙන් පසු නැවත පියවා තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 (2) (අ) (ආ) | තත්කාර්ය අත්තිකාරම් සීමාවන් ඉක්මවා නිලධාරීන් 4 දෙනෙකුට අවස්ථා 5 කදී එකතුව රු. 1,509,850 ක අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 371 (2) (ඇ) | නිලධාරීන් වෙත ලබා දී ඇති තත්කාර්ය අත්තිකාරම් අදාල කාර්යය නිමවී දින 10 ක් ඇතුළත පියවිය යුතු වුවද අවස්ථා දහයක දී නිලධාරීන් වෙත ලබා දී තිබූ රු.462,108 ක් පියවා නොතිබුණු අතර අවස්ථා 5 දී ලබා ගත් රු. 221,600 ක් වූ අත්තිකාරම් පියවීම දින 12 සිට දින 54 දක්වා කාල පරාසයක් තුළ ප්‍රමාද වී තිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 756 | මුදල් රෙගුලාසි ප්‍රකාරව පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAS/ 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵල රු. 36,960,804 ක ඌනතාවක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 2,626,061 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 34,334,743 කින් පිරිහී තිබුණි. වැටුප් හා අනෙකුත් දීමනා රු.44,104,317 කින් වැඩිවීම එයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ අඛණ්ඩ ඌනතාවයක් පෙන්නුම්කර තිබුණි. කෙසේ වුවද, සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී විශ්වවිද්‍යාලයේ දායකත්වය 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ධන අගයක් ගෙන තිබූ අතර එය, අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂය අවසානයට රු. 192,617,441 ක් වී තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**
-----------------------------

4.1 **කාර්යසාධනය**
-------------------------

ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි බුද්ධාගම පතුරුවාලීම සහ ධර්මදූත කටයුතු පෝෂණය කිරීම සඳහා බෞද්ධ ධර්මය සහ විනය පිළිබඳ ශාස්ත්‍රධරයන් පුහුණු කිරීම, පාලි භාෂාව , බෞද්ධ සංස්කෘතිය සහ බෞද්ධ දර්ශනය හැදෑරීම ප්‍රවර්ධනය කිරීම සහ වර්තමාන ලෝක තත්ත්වයන්ට ගැලපෙන පරිදි එම අධ්‍යයන නංවාලීම, පිරිවෙන්වල පාසල්වල හා ඒ හා සමාන ආයතනවල බුද්ධාගම හා පාලි භාෂාව ඉගැන්වීම සඳහා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සහ ගිහි පිරිමි ශිෂ්‍යයන් පුහුණු කිරීම, යන ප්‍රධාන අරමුණු පදනම් කරගෙන 1981 අංක 74 දරන පනත මඟින් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය ස්ථාපිත කර තිබුණි.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ බාහිර විභාග අංශය විසින් ඉකුත් වර්ෂයේ දී සාමාන්‍ය උපාධි 444 ක්, පශ්චාත් උපාධි ඩිප්ලෝමා 11 ක් හා පශ්චාත් උපාධි 124 ක් ප්‍රදානය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ පශ්චාත් උපාධි 121 ක් සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා 5 ක් පමණක් ප්‍රදානය කර තිබුණු නමුත් සාමාන්‍ය උපාධි කිසිවක් ප්‍රදානය කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය සතු සම්පත්වලින් වැඩි ප්‍රමාණයක් යොදවා සිදු කරන අභ්‍යන්තර උපාධි පිරිනැමීම, සාපේක්ෂව බාහිර උපාධි පිරිනැමීම ඉතා වැඩි මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. මේ අනුව පසුගිය වර්ෂ 5 ක් තුළ බාහිර උපාධි 1800 ක් පිරිනමා තිබුණද, එම කාළසීමාව තුළ පිරිනමන ලද අභ්‍යන්තර උපාධි ප්‍රමාණය 368 කට සීමා වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යයන කටයුතු සඳහා ශිෂ්‍යයින් 350 ක් වෙනුවෙන් දරන ලද මුළු පුනරාවර්තන වියදම් රු.289,950,228ක් වූ අතර, ඉකුත් වර්ෂයේ ශිෂ්‍යයින් 359 ක් වෙනුවෙන් දරන ලද මුළු පුනරාවර්තන වියදම රු.235,642,269ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය පිළිවෙලින් රු.828,429 හා රු.656,385ක් වූ අතර එය සියයට 26කින් වැඩි වී තිබුණි.

4.2 **කළමනාකරණ ක්‍රියාකාරකම්**
--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අත්තිකාරම් ලබා දී වර්ෂ 3 සිට 6 අතර කාලයක් ඉක්ම ගොස් තිබුණු රු. 1,367,386 කට අදාල ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කර නොතිබුණු අතර වගකිවයුතු නිලධාරීන්ගෙන් මෙම අත්තිකාරම් මුදල හා කාර්යසාධන බැඳුම්කර අයකර ගැනීමට හෝ නීතිමය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ iii වන පරිච්ඡේදයේ 26.1 උප වගන්තිය අනුව උසස් අධ්‍යාපන ආයතන මඟින් අන්‍ය වූ ආයතනවලින් බාහිර කථිකාචාර්යවරුන් ලබා ගැනීමේ පුරුද්ද අධෛර්යමත් කළ යුතු බව දක්වා ඇති නමුදු ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අනුමත කථිකාචාර්ය තනතුරු 44 ඉක්මවා බාහිර කථිකාචාර්යවරු 30 දෙදෙනෙකු සේවයේ යොදාවා ගෙන තිබූ අතර ඔවුන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.5,694,623 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි.

4.3 **මෙහෙයුම් ක්‍රියාකාරකම්**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ශිෂ්‍යත්ව හා ත්‍යාග අරමුදල් ආයෝජන ඉතුරුම් ගිණුමේ ශේෂය රු.2,424,883ක් වන අතර, එම මුදල ස්ථාවර තැන්පතුවල ආයෝජනය නොකර ඉතුරුම් තැන්පතුවක් ලෙස පවත්වාගෙන ගොස් තිබුණි.

(ආ) බෞද්ධ අධ්‍යයනයට හා පාලි භාෂාවට පමණක් සීමා වූ පර්යේෂණ වලට ආධාර කිරීම සඳහා පිහිටුවා තිබූ ජියුන් බෞද්ධ පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල 2006 වර්ෂයෙන් පසුව අදාල අරමුණ ඉටුකරවා ගැනීම සඳහා යොදවා ගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී අරමුදලට පරිබාහිර කටයුතු වෙනුවෙන් රු. 264,084 ක් වැයකර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයේදී අරමුදලේ ශේෂය රු.1,870,138 ක් විය.

4.4 **අරමුදල් ඌන උපයෝජනය**

---------------------------------

විශ්වවිද්‍යාලයේ ප්‍රාග්ධන වැඩිදියුණු කිරීම් සඳහා ලබාදෙන රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන උපයෝජනය ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි. ඉකුත් වර්ෂවලදී ලබාදුන් ප්‍රාග්ධන ප්‍රදාන රු. මිලියන 22 ක් උපයෝජනය කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ලද රු. මිලියන 99.2 කින් උපයෝජනය කර තිබුණේ රු.මිලියන 60 ක් පමණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට උපයෝජනය නොකළ මුළු ප්‍රාග්ධන ප්‍රදාන රු.මිලියන 61 ක් ඉක්මවා තිබුණි.

4.5 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශීය ශිෂ්‍යයන්ට නේවාසික පහසුකම් සැලසීමේ අරමුණින් ඉදිකළ නේවාසිකාගාර ගොඩනැගිල්ලෙහි ශිෂ්‍යයින් 208 දෙනෙකුට ඉඩ පහසුකම් සැලසිය හැකි වුවද සමාලෝචිත වර්ෂය අවසානයට විදේශීය සිසුන් 30 කට සහ ගිහි සිසුන් 25 දෙනෙකු සඳහා පමණක් ඉඩ පහසුකම් ලබා දී තිබුණ අතර රු. මිලියන 220 ක් වැය කර ඉදිකරන ලද ගොඩනැගිල්ල ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) වටිනාකම රු. 242,960 ක් වූ භාණ්ඩ අයිතම වර්ග 20 ක් වර්ෂ 2 සිට වර්ෂ 12 ක කාල පරාසයක ගබඩාව තුළ නිෂ්ක්‍රීයව පැවතුණි.

5. **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-----------------------------------------

5.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------

විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව දැව භාණ්ඩ, උපකරණ ඇතුළු භාණ්ඩ අයිතම 201 ක් මිල දී ගැනීමට රු. 4,671,162 ක ඇස්තමේන්තු කර තිබුණ ද සමාලෝචිත වර්ෂය පිරිවැය රු. 21,691,676 කට භාණ්ඩ අයිතම් 682 ක් මිල දී ගෙන තිබුණි. ඒ අනුව ආයතනයේ අවශ්‍යතා හඳුනා නොගෙන සහ අවශ්‍ය පුරෝකතනයන් පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇති බව නිරීක්ෂණය විය.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත පුනරාවර්තන වියදම හා තථ්‍ය වියදම සැසඳීමේ දී අයිතම අවස්ථා 11කදී සියයට 16 ක සිට සියයට 291 ක් දක්වා ඉතිරි වීම් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව නඩත්තු නොකිරීම. |
| (ආ) කොන්ත්‍රාත් පරිපාලනය | 2006 මාර්ගෝපදේශ සංග්‍රහයෙහි සඳහන් විධිවිධාන කෙරෙහි අවධානය යොමු කර නොතිබීම. |